2.9.14

# සැරියුත් හිමියන්ගේ ප්‍රඥාව පිළිබඳ අර්ථකථනය ඇසුරෙන් නිර්වාණයේ ඥාණ හා සදාචාර සංකල්ප පිළිබඳ විමසුමක්[1]

බුදුසමය විධිමත්ආචාර ධර්ම පද්ධතියක් හා ඊට පාදක වූ පරිපූර්ණ සෛද්ධාන්තික ඉගැන්වීම් සමූහයකින්ද යුක්ත ය[1]. එබැවින් බුදුසමය ඥාණමය (Epestemological)හා සදාචාරමය (Ethical)දෙඅංශයෙන් ම පරිපූර්ණ ආගමික චින්තනයක් ලෙස දැක්විය හැකිය. නිර්වාණාවබෝධය ලෙස අප හඳුන්වන්නේ එම ඥාණයේ හා සදාචාරයේ පාරප්‍රාප්තිය වන අතර එය ප්‍රඥාවේ (පාලි-පඤ්ඤා)පරිපූර්ණ උදාව ලෙස පෙන්වා දී තිබේ. පඤ්ඤා ඇසුරෙන් නිර්වාණයේ ඥාණමය හා සදාචාර අංග පිළිබඳ විමසා බැලීම මෙම ලිපියේ අරමුණවන අතර එහි දී පාදක කරගැනෙන්නේ මහාවෙදල්ල සූත්‍රයේ එන සැරියුත් තෙරණුවන්ගේප්‍රඥා සම්බන්ධ අර්ථකථනයයි.

## මහාවෙදල්ල සූත්‍රයේ ප්‍රඥාපිළිබඳ විග්‍රහය

මජ්ඣිමනිකායේ මහාවෙදල්ලසූත්‍රය[2]මහාකොට්ඨිත හිමියන් සැරියුත් හිමියන්ගෙන් විමුක්ති මාර්ගය හා සම්බන්ධ සංකල්ප පිළිබඳ නගන ප්‍රශ්න කීපයකට දෙවැන්නා විසින් සංක්ෂිප්තව දී ඇති පිළිතුරු කීපයකින් සමන්විත වෙයි. මෙහි දී පඤ්ඤාසම්බන්ධයෙන් මහා කොට්ඨිත හිමියන් විසින් නගා ඇති ප්‍රශ්න හතරක් ඇත. ඒවා පහත සඳහන් පරිදි ය ඃ

(i) කවර කරුණකින් පඥාවත් වේද?

(ii) විඤ්ඤාණ හා පඤ්ඤා එකිනෙකට සම්බන්ධ ද නොඑසේ නම් එකිනෙකින් වෙනස් වූයේ ද?

(iii) පඤ්ඤා හා විඤ්ඤාණ දෙකේ වෙනස කවරේද?

(iv) පඤ්ඤා කවර අර්ථයක් සඳහාද?යනුයි.

මේ ප්‍රශ්නවලට සැරියුත් හිමියන් විසින් දී ඇති පිළිතුරු පඤ්ඤාහි ඥාණය හා සදාචාරය පිළිබඳ ඉතා අගනා විමුක්ති කේන්ද්‍රීය (Sotereology) විවරණය ලෙස හඳුනා ගත හැකි වෙයි. මෙහි දී අපගේ විශේෂ අවධානයට යොමුවන්නේ ඉහත දැක්වුණු අවසාන පැණය වූ 'පඤ්ඤා කවර අර්ථයක් සාක්ෂාත් කර ගැනීම සඳහාද?'යන්නට සැරියුත් තෙරණුවන් විසින් සපයා ඇති පිළිතුරයි. එම ප්‍රශ්නයට සැරියුත් හිමියන්ගේ පිළිතුර වූයේ පඤ්ඤා අභිඥාර්ථය(*අභිඤ්ඤත්ථා*)පරිඥාර්ථය (*පරිඤ්ඤත්ථා*) හා ප්‍රහාණාර්ථය (*පහානත්ථා*) පිණිසවන බවයි. සැරියුත් හිමියන්ගේ මෙම කෙටි පිළිතුර පඤ්ඤා පිළිබඳ අර්ථකථනයක් ලෙස හඳුනා ගත හැකිය යන්න අපි යෝජනා කරමු.

පඤ්ඤා යන නාම පදයෙහි ක්‍රියා රූපය පජානාති (ප්‍රජානනය කරයි) යනුයි. ප්‍රස්තුත සූත්‍රයෙහි ම ප්‍රජානනය කිරීම යන්නෙහි අර්ථයද සැරියුත් හිමියන් විසින් මහාකොට්ඨිත හිමියන්ට පැහැදිලි කර දී ඇත. කවර කරුණෙකින් ප්‍රඥාවත් වේද යන පැණයට සැරියුත් හිමියන්ගේ පිළිතුර වන්නේ

---

[1] මෙම ලිපිය ලේඛකයා විසින් වෙනත් තැනක පළ කරන ලද ලිපියක් සංස්කරණය කොට මෙහි පළකරන ලද්දකි.